# සඳකඩපහණෙහි විචිත්‍රත්වය පිළිබඳ අධ්‍යයනයක්

ඉෂාරා මදුෂානි*

ශ්‍රී ලංකාවේ ගල් කැටයම්කරුවන්ගේ නිර්මාණ කුසලතාව අතිවිශිෂ්ට ලෙස ලොවටම පෙන්වාලිය හැකි නිර්මාණයක් ලෙස සඳකඩපහණ හඳුන්වා දිය හැකිය. මෙම නිර්මාණය සිංහල කලාවේ ආදීනත්වය ලොවට කියාපාන හොඳම නිදසුනකි. සඳකඩපහණ දොරටුවක මහේශාක්‍ය බවක්, අලංකාරයක් හා වැදගත් අර්ථයක්ද එක් කරයි. එය මුළු ගොඩනැගිල්ලේම සෞන්දර්යාත්මකබව ඔප් නැංවීම සඳහා පාදක වන සංකේතයකි. සඳකඩපහණේ ඉතිහාසය ක්‍රි.පූ 3 වන සියවස තරම් ඈතට විහිදී යයි. අඩ්ඪචන්දපාසාණ, අඩ්ඪචන්දකපදගණ්ඨිකා, අඩසඳ පහණ, සඳකඩපහණ ලෙසින් පැරණි මූලාශ්‍රයවල විවිධ නම් රාශියකින් ව්‍යවහාර වන්නා වූ මෙම ගොඩනැගිලි දොරටුව එකවරම අංග සම්පූර්ණව බිහිවූවක් නොවන අතර අදියරයෙන් අදියර ක්‍රමික විකාශනයකට ලක්වී සංවර්ධනය වූවක් බව එහි ප්‍රභවය පිළිබඳ සැලකීමේදී අවබෝධ කර ගත හැකිය. සඳකඩපහණේ මුල්ම අදියර "පාටිකා" නම් දිග හතරැස් ගල් පුවරුවක් විය. ඉන්පසු හතරැස් පාටිකාවේ ඉදිරි කොන් දක අර්ධ කවාකාර ලෙස හැඩ ගන්වා තිබේ. පසුව තවතවත් සංවර්ධනයට පත් වී විවිධ කැටයම් හා මෝස්තර එක්වීම සිදුව තිබේ. එලෙස එක්වන්නා වූ කැටයම් හා මෝස්තර සඳකඩපහනෙහි විචිත්‍රත්වයට මෙන්ම ආගමික සංකල්පයන් ඔප්නංවා පෙන්වීමට ද හේතු වී තිබේ. පැරණි ගොඩනැගිලි දොරටුවක් ලෙස සඳකඩපහණෙහි ඇති වැදගත්කම, නිර්මාණය කිරීමේදී භාවිත කොට ඇති විවිධ ක්‍රමෝපායන් හා නිර්මාණයට යොදාගත් සංකේත හඳුන්වාදීම මෙම පර්යේෂණයේ මුඛ්‍ය පරමාර්ථය වේ. පර්යේෂණය සිදු කිරීමේදී යොදාගත් ක්‍රමවේදය ලෙස සමන්තපාසාදිකාව, පාලි අටුවා, අමාවතුර වැනි ප්‍රාථමික මූලාශ්‍ර මෙන්ම පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය භාවිතයට ගන්නා ලදී. පැරණි ගොඩනැගිලි දොරටුවක් ලෙස කලාකරුවා අතින් සංවර්ධනයට පත් වී නිමැවුණු සඳකඩපහණෙහි ඇති ශ්‍රී විභූතිය ලොවටම පෙන්වා දීම සඳහා එය තව චිරාත් කාලයක් රැකගැනීම අප සතු වගකීමක් වන්නේ ය.

ප්‍රමුඛ පද - සඳකඩපහණ, කැටයම්, පාටිකා, ගොඩනැගිලි දොරටු, ලියවැල්.

* පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය isharamadushani41@gmail.com